<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව</u>

**අධ්‍යාපන අමාත්‍යාංශය**

පුරප්පාඩුව පවතින අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත මෙම අවස්ථාවේ දී පමණක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 3ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් දිප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>1. තෝරා ගනු ලබන ක්‍රමවේදය</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියකට අනුව, එම කමිටුව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ.

<u>2. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය</u>

මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, 2022.04.08 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවර <u>"ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා ඉල්ලුම් කිරීම"</u> යනුවෙන් සඳහන් කර එවිය යුතුවේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

<u>3. අවධානයට</u>

ලියාපදිංචි තැපෑලට යොමු කිරීමට ප්‍රථම, සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළයුතු වේ.

විද්‍යුත් තැපැල් ලිපිනය - esebranch.moe@gmail.com

මාතෘකාව - Calling application for the post of Chief Commissioner (NAME & ID No)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

2022.03.22

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

1. **ජ්‍යෙෂ්ඨතාවය** උපරිම ලකුණු 40

මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති ශ්‍රී ලං.අ.ප.සේවයේ සේවා ව්‍යවස්ථාව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ප්‍රකාර I ශ්‍රේණියේ අනිවාර්ය අවු: 03 ක සේවා කාලයට අතිරේකව ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට වසරකට ලකුණු 03 බැගින්

සටහන : (මාස 12 ක කාලයක් සඳහා පමණක් වසරකට හිමි මුළු ලකුණු සංඛ්‍යාවට හිමි වන අතර ඊට වඩා අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.)

2. **අධ්‍යාපන සුදුසුකම්** උපරිම ලකුණු 20

2.1 පශ්චාත් උපාධිය - ලකුණු 15

2.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 05

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සළකා බලන ලද සුදුසුකම් හැර උපයාගත් අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ලකුණු ලබා දීමේ දී සළකා බලනු ලැබේ. 2.1 සහ 2.2 අවස්ථා වලදී උපරිම සහතික / සුදුසුකම් 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

3. **පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** උපරිම ලකුණු 05

(ප්‍රායෝගික භාවිතය පිළිබඳව සළකා බලනු ලැබේ)

4. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** උපරිම ලකුණු 05

(සන්නිවේදන කුසලතාවය සළකා බලනු ලැබේ)

5. **අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** උපරිම ලකුණු 05

5.1 පර්යේෂණ - ලකුණු $2.5 \times 2$

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

5.2 ප්‍රකාශන - ලකුණු $2 \times 2$

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර , ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය මඟින් අනුමැතිය ලද ප්‍රකාශන පමණක් ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ.)

(උපරිම පර්යේෂණ හා ප්‍රකාශන දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

6. **සේවා ඇගයීම්** උපරිම ලකුණු 05

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා

සටහන : (දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වේ)

ඔබගේ ආයතනයේ, ඔබ විසින් රාජකාරි ඉටු කිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ ව්‍යාපෘතියක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | ප්‍රවේශය හා හැඳින්වීම | - ලකුණු 3 |
| II. | අන්තර්ගතය | - ලකුණු 3 |
| III. | කාල කළමනාකරණය | - ලකුණු 3 |
| IV. | ඉදිරිපත් කිරීමේ විලාශය | - ලකුණු 3 |
| V. | නිමාව හා නිගමනය | - ලකුණු 3 |

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (PowerPoint) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර ඔබ ඉදිරිපත් කරනු ලබන සිද්ධි අධ්‍යයනයට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබූ සමස්ථ කුසලතාව** උපරිම ලකුණු 05

100